පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

| ශ්‍රේණිය |
| --- |
| 07 |

විෂයය :- ... භූගෝල විද්‍යාව

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය පැය 2යි

<u>**සැලකිය යුතුයි . පළමු කොටසේ සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**</u>

## <u>1 - කොටස</u>

- අංක 1 - 5 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න

1) ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර පිහිටා ඇති පටු මුහුදු තීරය හඳුන්වන්නේ
   i. මලක්කා සමුද්‍ර සංධිය.
   ii. පෝක් සමුද්‍ර සංධිය
   iii. බීරින් සමුද්‍ර සංධිය
   iv. බෙංගාල බොක්ක                    යන නමිනි

2) දකුණු ආසියානු රටවල් අතරින් ආයු අපේක්ෂාව වැඩිම රටවල් දෙක වන්නේ
   i. ඉන්දියාව හා ශ්‍රී ලංකාව
   ii. ශ්‍රී ලංකාව හා භූතානය
   iii. මාල දිවයින හා ශ්‍රී ලංකාව
   iv. බංග්ලාදේශය හා භූතානය

3) භූමි කම්පාවක් ඇතිවීමට බලපාන හේතුවක් නොවන්නේ
   i. ගිනිකඳු පිපිරීම්
   ii. වනාන්තර විනාශය
   iii. න්‍යෂ්ටික පිපිරවීම්
   iv. පෘථිවි අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වය හා පීඩන වෙනස්කම්

4) වෙරළාශ්‍රිතව දක්නට ලැබෙන භූ ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
   i. බොකු කළපු ශේෂ කඳු දිය ඇලි
   ii. බොකු ලේවා කළපු වගුරු
   iii. සානු බොකු තුඩු ශේෂ කඳු
   iv. බොකු කළපු වගුරු දියඇලි

5) තෙත් කලාපීය භූ දර්ශනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය මින් කුමක්ද?
   i. ජල ගැලීම් හා නාය යෑම්
   ii. හුණුගල් පස හා භූගත ජලය
   iii. කටු පඳුරු සහිත ලඳු කැලෑ
   iv. වර්ෂාව මත රඳා පවතින හේන් වගාව

- අංක 6 - 10 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුරු යොදාගෙන හිස්තැන් පුරවන්න

6) …………………………..මෝසම් වර්ෂාව මගින් ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිතදිග ප්‍රදේශ වලට අධික වර්ෂාපතනයක් ලැබේ.

7) ලෝකයේ විශාලතම සාගරය වන්නේ …………………. …………………..සාගරයයි.

8) වියළි කලාපීය භූ දර්ශනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ ……………………………… පිහිටා තිබීමයි.

9) ආපදා කලමණාකරණයේ මූලිකාංග අතර ……………………………… ඉතා වැදගත් වේ.

10) …………………………… ජාතික උරුමයන් අතර ස්පෘශ්‍ය උරුමයන්ට අයත් ආගමික මධ්‍යස්ථානයකි.

( ශේෂ කඳු හා වැව් / ආක්ටික් / පැසිපික් / දියඇලි / පෙර සූදානම / නල්ලූර් කෝවිල / රන්මසු උයන / නිරිත දිග / ඊශාන දිග )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් x වැරදි ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න

11) සිතියමක් කියවීම සඳහා සූචකය වැදගත් වේ. (…. )

12) මාල දිවයින අත්ලන්තික් සාගරය තුළ පිහිටා ඇති දූපතකි (…. )

13) ශ්‍රී ලංකාවේ ආදි වාසීන් පැරණි සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමට ඉහළ දායකත්වයක් ලබා දේ . (…. ).

14) උතුරු අක්ෂාංශ අංශක 23.5 හඳුන්වන නාමය වන්නේ ආක්ටික් වෘත්තය ලෙසිනි. (…. ).

15) වාරි ජලය පදනම් කොට ගත් වී වගාව වියළි කලාපීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණයකි. (…. ).

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

16) ලොව මහද්වීප අතරින් කුඩාම මහද්වීපය ලෙස සැළකෙන්නේ ………………………..( දකුණු ඇමරිකා / උතුරු ඇමරිකා / ඕස්ට්‍රේලියා ) මහද්වීපයයි.

17) කටුනායක කොග්ගල බියගම යන නිදහස් වෙළඳ කලාප ……………………….. පිහිටීම නිසා ජනතාව එම ප්‍රදේශයන්හී ඒකරාශිව ඇත

( තෙත් කලාපයේය. / වියලි කලාපයේ ය/ කඳුකර කලාපයේය )

18) සුනාමියක් ඇතිවීමට බලපාන හේතුවක් ලෙස ………………. දැක්විය හැකිය.

( මුහුදේ ඇතිවන භූමිකම්පා . / මහා පරිමාන ගොඩනැගිලි ඉදි කිරීම්/ ජල දූෂණය)

19) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත අනුව ( 2014 ) මාතෘ මරණ අනුපාතිකය අඩුම දකුණු ආසියාතික රට ලෙස සැලකෙන්නේ ………………..…. යි ( බංග්ලාදේශය / මාල දිවයින / ශ්‍රී ලංකාව )

20) ගොඩබිම සිට නාවික සැතපුම් 24 - 200 දක්වා මුහුදු සීමා කලාපය හඳුන්වන නාමය වන්නේ……………………..යි ( යාබද මුහුදු කලාපය / රාෂ්ට්‍රිය මුහුදු කලාපය / අනන්‍ය ආර්ථික කලාපය )

(ලකුණු 2×20 = 40 යි )


11 – කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර 2 වන ප්‍රශ්නයේ සිට 7 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

1) (අ) පහත සදහන් ස්ථාන ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න

කොළඹ / හික්කඩුව / වළවේ ගඟ / පේද්‍රුරු තුඩුව / පරාක්‍රම සමුද්‍රය / ත්‍රිකුණාමලය

(ලකුණු 2×6 = 12 )



(ආ)



a

i. මෙම  චිත්‍ර දක්නට ලැබෙන්නේ කොහේද

ii. මෙම ස්ථානය ලෝක උරුමයක් වන අතර එය අයත් වන්නේ ස්පෘශ්‍ය උරුමයක් ලෙසින් ද අස්පෘශ්‍ය උරුමයක් ලෙසින් ද

b



i. මෙම පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද ?

ii. මෙය පිහිටා ඇත්තේ කුමන නගරයේද  ?



C

i. මෙහි දැක්වෙන වගාව කුමක්ද ?

ii මෙම වගාව දක්නට ලැබෙන දේශගුණික කලාපය කුමක්ද ?



d


i. පින්තූරයේ දැක්වෙන දෑ නම් කරන්න

ii. මෙය භාවිතා කරනු ලබන්නේ කුමන කාර්යයක් සඳහාද ?

(ලකුණු 2× 4 = 8)

2)

i. පහත දැක්වෙන ලංකා සිතියමේ A B යන අක්ෂර වලින් දක්වා ඇති මෝසම් සුළං වර්ග දෙක නම් කරන්න.




( ලකුණු 2 යි )

ii. වාසුලි වර්ෂාවේ විශේෂ ලක්ෂණ තුනක් ලියා දක්වන්න. ( ලකුණු 3 යි )

iii. a ශ්‍රී ලංකාවේ ශාක ව්‍යාප්තියට බලපාන දේශගුණික සාධක දෙකක් නම් කරන්න

b එක් එක් කලාපයන්හි පැතිර පවතින වනාන්තරයන් හි වෙනස් කම් පිළිබඳව කෙටියෙන් තොරතුරු ලියා දක්වන්න ( ලකුණු 5 යි )

3)

i. ශ්‍රී ලංකාවේ වයඹ දිශාවේ පිහිටි දූපත් දෙකක් නම් කරන්න. ( ලකුණු 2 යි )

ii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න. ( ලකුණු 3 යි )

iii. මධ්‍ය කඳුකරයේ ස්වභාවික සෞන්දර්ය විදහා දක්වන භූ විෂමතා ලක්ෂණ තුනක් දක්වා ඉන් එක් ලක්ෂණයක් පිළිබඳව කෙටියෙන් විස්තරයක් කරන්න. ( ලකුණු 5 යි )

4)

i. පහත සඳහන් ස්ථාන අතරින් ලෝක උරුමයන් ලෙස නම්කොට ඇති ස්වභාවික නිර්මිතයන් දෙකක් නම් කරන්න.

ii. ( යාපන කොටුව සිංහරාජ වනාන්තරය සීගිරිය හික්කඩුව වෙරළ රන්මසු උයන ) ( ලකුණු 2 යි )

iii. පහත සඳහන් ආගම් අදහන්නන් විසින් සමරනු ලබන ආගමික උත්සව එක බැගින් ලියන්න.

බෞද්ධ

හින්දු

ඉස්ලාම් (ලකුණු 3 යි )

iii ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෝක උරුම අතරින් මානව නිර්මිත ලෝක උරුමයන් තුනක් දක්වා ඉන් එක් ස්ථානයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. ( ලකුණු 5 යි )

5)

i. සංචාරකයන්ගේ වැඩි ආකර්ෂණයක් දිනා ගත් ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා .දකුණු යන පළාත් වලට අයත් දර්ශනීය වෙරළ තීර සහිත ප්‍රදේශ දෙකක් නම් කරන්න.

(ලකුණු 2 යි )

ii. වෙරළ ආශ්‍රිතව පිහිටි සම්පත් උපයෝගි කරගෙන සිදු කරනු ලබන කර්මාන්ත වර්ග තුනක් ලියා දක්වන්න. ( ලකුණු 3 යි )

iii. මිනිස් ක්‍රියාකාරකම් නිසා වෙරළ භූ දර්ශනයට සිදුවන හානි පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

( ලකුණු 5 යි )

6)

i. ශ්‍රී ලංකාවේ ඇතිවන ස්වභාවික ආපදා වර්ග දෙකක් නම් කරන්න ( ලකුණු 2 යි )

ii. ස්වභාවික ආපදාවක් ලෙස නියග ඇති වීමට බලපාන හේතු තුනක් ලියන්න ( ලකුණු 3 යි )

iii. නාය යෑම් වලින් සිදුවන හානි තුනක් දක්වා ඉන් එකක් පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න.

( ලකුණු 5)

7)

i. දේශගුණික වෙනස්වීම් ඇති වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න ( ලකුණු 2 යි )

.

ii. ශ්‍රී ලංකාවේ අධික වැසි තත්ත්වයන් නිසා ඇතිවන ආපදාවන් තුනක් නම් කරන්න. ( ලකුණු 3 යි )

iii. දේශගුණික වෙනස් වීම් අවම කිරීමට ගෙනඇති ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එක් කරුණක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. ( ලකුණු 5 යි )